# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය. | நிதி அமைச்சு | MINISTRY OF FINANCE
මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | THE SECRETARIAT COLOMBO 01


මගේ අංකය / எனது இல / My No: DMA/ADG-1/පොදු/2021

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.11. 15

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**<u>අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ</u>**

උක්ත කරුණට අදාළව මාගේ 2019.01.12 දිනැති අංක DMA/01-2019 කළමනාකරණ විගණන චක්‍රලේඛය හා බැඳේ.

එම චක්‍රලේඛය මගින් ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය සමාලෝචනය සඳහා හඳුන්වා දෙන ලද ඇමුණුම් අංක 5 යටතේ වන ආකෘති අංක 01 මේ සමග සංශෝධනය කරනු ලබන අතර 2022 වසරේ සිට මෙම සංශෝධිත ආකෘති අංක 01 ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය සමාලෝචනය සඳහා උපයෝගී කර ගන්නෝ නම් මැනවි.

මෙම ආකෘතිය සංශෝධනය කිරීමේ මූලික අරමුණ වනුයේ එක් එක් ප්‍රාග්ධන වියදම් සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම හා ඒ සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සමග සත්‍ය භෞතික හා මූල්‍ය ප්‍රගතිය මැන බැලීමය.ඒ අනුව ආකෘතිය සම්පූර්ණ කිරීමේදී සෑම ප්‍රාග්ධන වියදමක් සඳහාම වර්ෂය ආරම්භයේ පිළියෙළ කළ ක්‍රියාකාරී සැලැස්ම හා ඊට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කළ යුතුය. ඉන් අනතුරුව එකී ප්‍රාග්ධන වියදමට අදාළ මූල්‍ය හා භෞතික ප්‍රගතිය දැක්විය යුතු වේ.

එහිදී විගණන හා කළමනාකරණ කමිටු කැඳවනු ලබන අභ්‍යන්තර විගණකගේ ප්‍රධාන වගකීමක් වනුයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීමට ප්‍රථම අදාළ ආයතන වලින් නිවැරදි හා සම්පූර්ණ කරන ලද තොරතුරු මෙම ආකෘති පත්‍රයට අනුව ලබාගෙන විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමයි.

එමෙන්ම පුනරාවර්තන වියදම් වලට සම්බන්ධ මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම සඳහා ඇමුණුම් අංක 05 හි 01 ආකෘතියෙහි (අ) උප ආකෘතිය භාවිත කළ යුතුය.

ඒ අනුව සියලුම දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මෙම ආකෘතිය යාවත් කාලීන කර කාර්තු පදනමින් පවත්වනු ලබන විගණන කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමටත්, අමාත්‍යාංශ සම්බන්ධ වනවිට එකී අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන වාර්තාවට අමතරව එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වල ප්‍රගති සමාලෝචන වාර්තාද අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණක වෙත උපදෙස් දෙන්නෝ නම් කෘතඥ වෙමි.

එස්.ඒ.චන්ද්‍රිකා කුලතිලක

අධ්‍යක්ෂ ජනරාල්

## …………..වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනය

ආකෘතිය -01

| ආයතනයේ නම | වැය විෂය අංකය | වියදම් විස්තරය | අයවැය ප්‍රතිපාදන | ප්‍රගති සමාලෝචනය | පළමු කාර්තුව | | | දෙවන කාර්තුව | | | තෙවන කාර්තුව | | | සිව්වන කාර්තුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ජන | පෙබ | මාර්තු | අප්‍රි | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| **උදා:කළම නාකරණ විගණන දෙපා** | **2101** | **වාහන** | **මිලියන 05** | **ක්‍රියාකාරී සැලැස්ම** | | ✓ | ✓ | | | | ✓ | | | | | |
| | | | | **ප්‍රසම්පාදන සැලැස්ම** | **S** | | **A** | | **R** | | | **P** | | | | |
| | | | | **මූල්‍ය ප්‍රගතිය (රු.)** | | | | | | | | **රු.මි 5** | | | | |
| | | | | **භෞතික ප්‍රගතිය (%)** | | | | | | | **100 %** | | | | | |
| 02 | | | | ක්‍රියාකාරී සැලැස්ම | | | | | | | | | | | | |
| | | | | ප්‍රසම්පාදන සැලැස්ම | | | | | | | | | | | | |
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.) | | | | | | | | | | | | |
| | | | | භෞතික ප්‍රගතිය (%) | | | | | | | | | | | | |
| 03 | | | | ක්‍රියාකාරී සැලැස්ම | | | | | | | | | | | | |
| | | | | ප්‍රසම්පාදන සැලැස්ම | | | | | | | | | | | | |
| | | | | මූල්‍ය ප්‍රගතිය (රු.) | | | | | | | | | | | | |
| | | | | භෞතික ප්‍රගතිය (%) | | | | | | | | | | | | |

**S** - ටෙන්ඩර් පටිපාටිය ආරම්භ කිරීම
A - කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම
R - භාණ්ඩ හා සේවා ලැබීම
P - ගෙවීම

ආකෘතිය-01(අ)

# ..............වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම් හි ප්‍රගති සමාලෝචනය

| අනු අංකය | වියදම් කාණ්ඩය | වාර්ෂික ප්‍රතිපාදන(රු) | පළමු කාර්තුව | | | දෙවන කාර්තුව | | | තෙවන කාර්තුව | | | සිව්වන කාර්තුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ජන | පෙබ | මාර් | අප්‍රි | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| 01 | පුද්ගලික පඩි නඩි | | | | | | | | | | | | | |
| 02 | ගමන් වියදම් | | | | | | | | | | | | | |
| 03 | සැපයුම් | | | | | | | | | | | | | |
| 04 | නඩත්තු වියදම් | | | | | | | | | | | | | |
| 05 | සේවා | | | | | | | | | | | | | |
| 06 | මාරු කිරීම් | | | | | | | | | | | | | |
| 07 | පොළී ගෙවීම් | | | | | | | | | | | | | |
| 08 | වෙනත් පුනරාවර්තන වියදම් | | | | | | | | | | | | | |
| 09 | මුළු වියදම | | | | | | | | | | | | | |